කැලණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර )-2021

2023 ඔක්තෝබර්

**BCOME 1035 - මූල්‍ය ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 04 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක : 01**

අ. "මූල්‍ය ගිණුම්කරණයේ" වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 යටතේ "දේපළ පිරියත හා උපකරණ" යන යෙදුම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. ගිණුම්කරණ පරිසරයේ සංරචක 05 නම්කරන්න. ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඉ. "කළමනාකරණ ගිණුම්කරණය" මූල්‍ය ගිණුම්කරණයෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක : 02**

අ. දේශීය ශාඛාවක් සහ විදේශීය ශාඛාවක් අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. පහත ගනුදෙනු ප්‍රධාන කාර්යාලයේ ගිණුම් පොත් වල සහ ශාඛාවේ ගිණුම් පොත් වල වෙන වෙනම සටහන් කරන්න.

i. ප්‍රධාන කාර්යාලය විසින් ශාඛාවට යවන ලද භාණ්ඩ තොගය - රු.1,527,000.

ii. ඉහත භාණ්ඩ තොගයෙන් රු.324,000 ක් වටිනා භාණ්ඩ නැවත ප්‍රධාන කාර්යාලය වෙත හරවා යවන ලදී.

iii. ශාඛාව විසින් දරන ලද ශාඛා වියදම් - රු.55,000.

iv. ප්‍රධාන කාර්යාලය විසින් දරන ලද ශාඛාවේ ජල වියදම රු.12,000.

v. ශාඛාව විසින් රු.423,000 ක් වටිනා භාණ්ඩ තොගයක්, තුන්වන පාර්ශවයකින්, ණය පදනම මත මිලදී ගන්නා ලදී.

vi. ශාඛා විකුණුම් වටිනාකම (ණය පදනම මත) - රු.3,975,000.

vii. ශාඛාවට අදාල ණයගැතියන්, ප්‍රධාන කාර්යාලය වෙත කල ගෙවීම් රු.85,000 කි.

viii. ප්‍රධාන කාර්යාලය විසින්, රු.225,000 ක් වටිනා ශාඛා ගැනුම් දරන ලදී.

ix. ශාඛාව මිලදී ගත් පරිගණකය රු.475,000 කි.

x. ශාඛාව විසින්, රු.110,000 ක් වටිනා ගෘහ භාණ්ඩ කට්ටලයක් ඔවුන්ගේ භාවිත සඳහා මිලදී ගන්නා ලදී. නමුත්, එම ගෘහ භාණ්ඩ කට්ටලයට අදාල ගිණුම ප්‍රධාන කාර්යාලයේ පොත්වල පවත්වාගෙන යන ලදී .

(ලකුණු 20)

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක : 03

අ. පහත දැක්වෙන යෙදුම් කෙටියෙන් පැහැදිලිකරන්න.

a) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS 01)
b) තොග (LKAS 02)
c) ණය ගැනීමේ පිරිවැය (LKAS 23)
d) කල්බදු (LKAS 17)
e) සාධාරණ වටිනාකම මිනුම්කරණය (SLFRS 13)

(ලකුණු 02x05 = 10)

ආ. 2023 වර්ෂයේ ජනවාරි 31 දිනට පහන් සහ සහන් හවුල්ව්‍යාපාරයේ මූල්‍ය තත්වය පහත දැක්වේ.

| ප්‍රාග්ධනය/ වගකීම් | වටිනාකම (රු.) | වත්කම් | වටිනාකම (රු.) |
|---|---|---|---|
| සංචිත අරමුදල | | ගොඩනැගිලි | 945,000 |
| පහන් | 800,000 | කීර්තිනාමය | 675,000 |
| සහන් | 670,000 | ආයෝජන | 280,000 |
| ආයෝජන උච්චාවචන අරමුදල | 475,000 | ණයගැතියෝ – වෙන්කිරීම් (350,000 - 26,000) | 324,000 |
| පහන්ගේ ණය | 60,000 | භාණ්ඩ තොග | 100,000 |
| සහන්ගේ ණය | 45,000 | බැංකු මුදල් | 76,000 |
| ණයහිමියෝ | 350,000 | | |
| එකතුව | **2,400,000** | එකතුව | **2,400,000** |

2023 වර්ෂයේ ජනවාරි 31 වන දින හවුල්කරුවන් විසින් හවුල්ව්‍යපාරය විසිරුවාහැරීමට තීරණය කරන ලද අතර එදින පහත ගනුදෙනු වාර්තා විය.

i. හවුල්ව්‍යපාරය විසින් රු.45,000 ක් වටිනා භාණ්ඩ තොගයක් පවරා, පහන්ගේ ණය මුදල පියවන ලදී.

ii. සහන් විසින් හවුල්ව්‍යපාරයේ ආයෝජන වලින් 3/5 ක්, එහි වටිනාකමෙන් 10%ක් අඩුවෙන් පවරා ගන්නා ලදී.

iii. ණයගැතියෝ රු.225,000 කට උපලබ්ධි විය.

iv. රු.17,000ක් අඩුවෙන් ණයහිමියෝ පියවන ලදී.

v. ගොඩනැගිලි රු.1,500,000 කට උපලබ්ධි විය.

vi. කීර්තිනාමය රු.700,000 කට තක්සේරු කර ඇත.

vii. හවුල්ව්‍යපාරයේ ඉතිරි ආයෝජන රු.115,000 කට විකුණන ලදී.

viii. හවුල්ව්‍යපාරයේ පොත්වල වාර්තා නොවූ පරිගණකයක්, පහන් විසින් රු.125,000 කට පවරාගන්නා ලදී.

ix. උපලබ්ධි වියදම රු.42,000 කි.

පහත ගිණුම් පිළියෙල කරන්න.

a) උපලබ්ධි ගිණුම

b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්

c) බැංකු ගිණුම

(ලකුණු 15)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක :** 04

අ. හවුල්ව්‍යාපාරයක් ඒකාබද්ධ කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. මැක්සි සහ නූරි හවුල් ව්‍යාපාරය සහ ඔපෙක් සහ පූරි හවුල් ව්‍යාපාරය යන ව්‍යාපාර යුගලය, 2023 වර්ෂයේ අප්‍රේල් 01 වන දින 'ලෝඩ්-ඉන්ක් සමාගම' යන නමින් ඒකාබද්ධ කිරීමට එකඟ විය. එම දිනට, පැවති ව්‍යාපාර දෙකෙහි ශේෂ පත්‍ර පහත පරිදි විය.

| ප්‍රාග්ධනය/ වගකීම් | මැක්සි සහ නූරි හවුල් ව්‍යාපාරය (රු. 000) | ඔපෙක් සහ පූරි හවුල් ව්‍යාපාරය (රු. 000) | වත්කම් | මැක්සි සහ නූරි හවුල් ව්‍යාපාරය (රු. 000) | ඔපෙක් සහ පූරි හවුල් ව්‍යාපාරය (රු. 000) |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | | | ගොඩනැගිලි | 190,000 | - |
| මැක්සි | 160,000 | - | කීර්තිනාමය | - | 225,000 |
| නූරි | 140,000 | - | ආයෝජන | 140,000 | - |
| ඔපෙක් | - | 130,000 | ණයගැතියෝ | 180,000 | 160,000 |
| පූරි | - | 125,000 | භාණ්ඩ තොග | 40,000 | 115,000 |
| පොදු සංචිත | 130,000 | - | | | |
| ණයහිමියෝ | 120,000 | 133,000 | | | |
| බැංකු ණය | - | 112,000 | | | |
| | | | | | |
| එකතුව | **550,000** | **500,000** | එකතුව | **550,000** | **500,000** |

මැක්සි සහ නූරි 2:3 අනුපාතයට ලාභා/අලාභ බෙදාගත් අතර, ඔපෙක් සහ පූරි සමානව ලාභා/අලාභ බෙදාගන්නා ලදී.

ඒකාබද්ධකිරීමේ කොන්දේසි පහත පරිදි විය:

I. නව සමාගම වන ලෝඩ්-ඉන්ක් සමාගම විසින්, මැක්සි සහ නූරි හවුල් ව්‍යාපාරයට අයිති ගොඩනැගිල්ල රු.200,000,000 කට පවරා ගන්නා ලදී.

II. නමුත්, මැක්සි සහ නූරි හවුල් ව්‍යාපාරයේ ආයෝජන, ලෝඩ්-ඉන්ක් සමාගම විසින් පවරා නොගන්නා ලදී.

III. මැක්සි සහ නූරි හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය වටිනාකමක් නැතැයි එකඟ විය.

IV. ඉහත ගැලපීම් වලින් පසු, රු.5,000,000 බැගින් අමතර ප්‍රාග්ධනය නව ව්‍යාපාරයට යෙදවීමට ඔපෙක් සහ පූරි එකඟ විය.

අවශ්‍ය වන්නේ;

i. මැක්සි සහ නූරි හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් වසාදැමීම සඳහා, 2023 අප්‍රේල් 01 දිනට ලෙජර් ගිණුම් පිළියෙළ කිරීම.

(ලකුණු 07)

ii. ඔපෙක් සහ පූරි හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් වසාදැමීම සඳහා, 2023 අප්‍රේල් 01 දිනට ලෙජර් ගිණුම් පිළියෙළ කිරීම.

(ලකුණු 08)

iii. 2023 අප්‍රේල් 01 දිනට ලෝඩ්-ඉන්ක් සමාගමෙහි ශේෂ පත්‍රය පිළියෙළ කිරීම.

(ලකුණු 05)

**(මුළු ලකුණු 25)**